16 පාඩම
षोडषः पाठः

# දිය දෝතයි; දිවි රැකුමයි

## वनितायां वार्ता



चित्रं पश्य

चतस्त्रः वनिताः जलाय आगतवत्याः। एका जलं आदाय गृहं व्रजति। अन्या भाजनेन सरसः जलं उद्ग्रहीतुं आरब्धा। तत् पांशुमिश्रितजलम्। ग्रीष्मे अस्मिन् प्रदेशे पारिशुद्धपानीयजलं लब्धुं महोत्साहं कर्तव्यम्। अत्रान्तरे द्वे वनिते हसत्यौ विनोदेन सल्लँपतः। जलं भाजनात् बहिः स्त्रवते। तत् अनाधृत्य ते सम्भाषितुं इच्छतः। अयं महापराधः। आहारेण विना अस्माभिः कतिपय दिनानि अपि जीवितुं शक्यम्। किन्तु जलेन विना होराद्वयम् अपि सुखेन उषितुम् अशक्यम्। जलमूलाश्रयाणि स्वभावधर्मस्य अतिशयानर्घाणि अङ्गाणि। तस्मात् प्राणं द्वितीयं कृत्वा अस्माभिः जलं रक्षितव्यम्।

## 16.1 අභ්‍යාසය

1. ඉහත දක්වා ඇති ඡේදයේ සඳහන් සියලු පූර්වක්‍රියාපද සහ තුමන්ත ක්‍රියාපද උපුටා ගෙන වෙන වෙන ම ලැයිස්තුවක් සකසන්න.

2. ගුරුතුමාගේ උදවු ඇතිව මෙම ඡේදය සිංහලයට නඟන්න.

3. සියලුදෙනා එක් ව ඡේදය ශබ්ද නඟා කියවන්න.


## 16.2 අභ්‍යාසය

1. පහත දැක්වෙන පද නිවැරදි අනුපිළිවෙළට පෙළගස්වා වාක්‍ය නිර්මාණය කර අභ්‍යාස පොතේ ලියන්න.

१. गृह्णाति / आगम्य / जलं / बिलात् / ग्रहीतुं / वनिता / जलाय ।
२. जलं / द्वे / सा / एव / भाजने / अनयत् / नेतुं ।
३. पुष्पाणि / विहारोद्यानं / गन्तुं / श्रामणेरः / चेतुं / चिन्तयति ।
४. कालं / जलाय / द्वे / सल्लँपितुं / गत्वा / नयतः / हसितुं च / वनिते ।
५. दातुं / आवश्यकानि / धनवान् / चिन्तयित्वा / चेतुं / समारभत / द्रव्याणि / महादानं ।
६. गन्तुं / आगच्छति / पातुं / वनात् / नदीं / जलं / गजयूथः ।
७. देशयितुं / नाम / धर्मं / बुद्धः / वाराणसी / अगच्छत् / नगरं ।
८. बुद्धं / प्रतिग्रहीतुं वा / न गच्छामः / भिक्षवः / इति / कर्तुं / वा / आतिथ्यं / पञ्चवर्गीयाः / अमन्त्रयन् / दृष्ट्वा ।

2. ගුරුතුමාගේ උදවු ඇතිව ඔබ පිළිවෙළින් සැකසූ වාක්‍ය සිංහලයට පෙරළා අභ්‍යාස පොතේ ලියා වැරදි නිවැරදි කරගන්න.

## 16.3 අභ්‍යාසය




1. ඉහත රූපය ඔබේ අභ්‍යාස පොතෙහි ඇඳගන්න. කුඩා රවුමේ ඇති වර්තමානකාල ක්‍රියාපදවලින් පූර්වක්‍රියාපද හා තුමන්ත ක්‍රියාපද සාදා සපයා ඇති නිදසුන අනුව ලොකු රවුම් දෙකෙහි ලියන්න. ගුරුතුමාගේ සහාය ලබාගන්න.

2. ඔබ සැදූ පූර්ව ක්‍රියාපද හා තුමන්ත ක්‍රියාපද අතුරෙන් කැමති පද 5ක් තෝරාගෙන ඒවායේ සිංහල අර්ථ දක්වන්න. එම සිංහල අර්ථ යොදා සරල සිංහල වාක්‍ය 5ක් සිංහලයෙන් නිර්මාණය කරන්න. ගුරුතුමාගේ උදවු ඇතිව එම සිංහල වාක්‍ය සංස්කෘතයට නගා දේවනාගරී අකුරින් ලියා දක්වන්න. ගුරුවරයාගේ සහය ඇතිව වැරදි නිවැරදි කරගන්න.

## අභ්‍යාස සඳහා උපකාරක පද

### නාමපද

| | | | |
|---|---|---|---|
| स्थल | - පොළොව | देशनशाला | - දේශන ශාලාව |
| मत्स्य | - මාළුවා | बिल | - බිලය, කුඩා සිදුර |
| श्लोकार्थ | - ශ්ලෝකයේ තේරුම | विहारोद्यान | - විහාර උයන |
| उद्यान | - උයන | आवश्यक | - ඉතා අවශ්‍ය |
| कासार | - විල | द्रव्य | - බඩු/ ද්‍රව්‍ය |
| आश्रम | - විහාරය/ අසපුව | महादान | - ලොකු දානය |
| प्रचारभूमि | - තණබිම | धनवत् | - ධනවතා |
| शयन | - ඇඳ | गजयूथ | - ඇත් රංචුව |
| कालिङ्गदेश | - කාලිංග නම් දේශය | वाराणसी | - බරණැස |
| घट | - කළය | आतिथ्य | - ආගන්තුක සත්කාරය |
| दक्षिणपार्श्व | - දකුණු පැත්ත | पञ्चवर्गीय | - පස් වර්ගයට අයත් |
| निष्कारण | - නිකරුණේ | जन्मदिन | - උපන් දිනය |
| उत्साह | - උනන්දුව | नय | - ආකාරය/ ක්‍රමය |
| अपराध | - අපරාධය | दीर्घायुष | - දිගු ආයුෂ |
| उद्यम | - උත්සාහය | बालकाल | - කුඩා/ ළදරු කාලය |
| भवत् | - පින්වත් තැනැත්තා | अतिशय | - ඉතා |
| काल | - මරණය/ කාලය | प्राचार्य | - ගුරුතුමාගේ ගුරුවරයා |
| दुःखित | - දුකට පත් | उपाध्याय | - ගුරුවරයා (පැවිදි කළ) |

| | | | |
|---|---|---|---|
| प्रव्रज्या | - පැවිද්ද | रोगी | - රෝගී වූ |
| अतिकारुणिक | - ඉතා කරුණාවන්ත | अतिरेकाहार | - වෙනත් ආහාර |
| शैद्धायन | - පිරිසිදු කිරීම | सम्मार्जन | - අතුගෑම |
| लिखित | - ලියූ, ලියූ දේ | अध्ययनकार्य | - ඉගෙනීම් කටයුතු |
| बाहिर | - වෙනත් | कृताभ्यास | - කළ අභ්‍යාස |
| अमन्द | - අඩුවක් නැති | लेखनोपकरण | - ලියන උපකරණ |
| सायाह्न | - සවස් කාලය | स्वहस्त | - තම අත |
| द्वार | - දොරටුව | प्रत्यागमनवेला | - ආපසු එන වෙලාව |
| विस्मय | - පුදුමය | स्नेह | - සෙනෙහස/ ආදරය |
| विद्यापीठ | - උසස් විද්‍යාලය | जनक | - පියා |
| प्रत्यय | - හේතුව, ආධාරය | सहस्र | - දහස |
| ग्रीष्म | - උණුසුම, ග්‍රීෂ්ම කාලය | विरल | - ටිකක්/ ස්වල්ප |

## ක්‍රියා පද

| | | | |
|---|---|---|---|
| निक्षिपति | - ඉවත දමයි | सम्भाषति | - එක්ව කථා කරයි |
| दृश्यते | - දක්නා ලැබේ | आह्वयति | - කැඳවයි |
| सुकर | - පහසුවෙන් කළහැකි | आरभते | - අරඹයි |
| प्रस्थित | - පිටත් වූ | स्रवति | - වැගිරෙයි |
| यतते | - වෙරදරයි | उत्सहते | - උනන්දු වෙයි |
| उद्यमते | - උනන්දු වෙයි | गृह्णाति | - ගනී |
| प्रतिगृह्णाति | - පිළිගනී | मन्त्रयति | - කොඳුරයි |
| जानाति | - දැනගනී | आलोचयति | - බලයි |
| सल्लँपति | - කථාවෙහි යෙදෙයි | भुञ्जापयति | - කවයි |
| पृच्छति | - අසයි, ප්‍රශ්න කරයි | आशंसति | - ආශීර්වාද කරයි |
| उपदिशति | - උපදෙස් දෙයි | प्रतीक्षते | - නැවත බලයි |
| धोवति | - සෝදයි | चोदयति | - පොලඹවයි |

| | | | |
|---|---|---|---|
| स्थापयति | - තැන්පත් කරයි | शोषयति | - වේලයි |
| परिश्रमति | - වෙහෙස වෙයි | विमर्शयति | - සොයා බලයි |
| शक्नोति | - හැකි වෙයි | प्राप्नोति | - පැමිණෙයි/පත්වෙයි |
| उद्गृह्णाति | - උඩට අදියි | | |

**නිපාත පද**

| | | | |
|---|---|---|---|
| साधुकम् | - හොඳින් | अपि | - ද |
| इति | - යැයි, කියා | कुतः | - කෙසේ / කොයින් |
| किम् | - කිමෙක් ද?/ කුමක් ද? | वा | - හෝ |
| अद्य | - අද | तर्हि | - එවිට/ එසේනම් |
| सततम् | - නිතර | प्रतिदिनम् | - දිනපතා |
| स्वयम् | - තමා | यदा | - යම් දිනක |
| तदा | - එකල | बहिः | - පිටත |
| नूनम् | - ඒකාන්තයෙන් ම | | |

භාවිතයට

काव्यशास्त्रविनोदेन - कालो गच्छति धीमताम् ।
व्यसनेन च मूर्खानाम् - निद्रया कलहेन वा ॥

නිර්මාණයෙන්, ශාස්ත්‍රීය කටයුතුවලින් හා යහපත් විනෝදාස්වාදයෙන් නුවණැත්තන්ගේ කාලය ගත වෙයි. අඥානයින්ගේ කාලය ගත වන්නේ විපතක් කිරීමෙන්, නිදා ගැනීමෙන් හෝ කලකෝලහල කිරීමෙනි.